# ව්‍යවසායකත්ව අධ්‍යයනය

# 10 -ශ්‍රේණිය




යූ.බී.අයි.එස්.අබේවර්ධන

කෑ/දෙහි/මානියම්ගම මහා විද්‍යාලය

# 2 පාඩම

*නිපුණතාවය 1.2*

*ව්‍යවසායකත්වය හා ව්‍යාපාර අතර අන්‍යෝන්‍ය සම්බන්ධතාවය විමසයි*

## ✓ ඉගෙනුම් ඵල

*ව්‍යාපාරවල ස්වභාවය සාකච්ඡා කරයි.

* ව්‍යවසායකයා හා ව්‍යාපාරිකයා අතර සමානකම් ද අසමානකම් සසදයි.

*ව්‍යවසායකයින් වර්ග නිදසුන් දක්වමින් පැහැදිලි කරයි.















අප එදිනෙදා ජීවිතයේ දෛනික අවශ්‍යතා හා වුවමනා සපුරාගැනීමට විවිධ භාණ්ඩ හා සේවාවන් පරිහරණය කරනු ලැබේ. ඒ සෑම අවස්ථාවකටම ගැළපෙන පරිදි නිර්මාණය වූ විශේෂිත භාණ්ඩ හා සේවාවන් ඇත. මේවා නිර්මාණය කරනු ලබන්නේ විවිධ ආයතන හෝ පුද්ගලයන් විසින්ය.

# ව්‍යාපාරයක් යනු


**මිනිස් අවශ්‍යතා හා වුවමනා සපුරාලීම සදහා හාණ්ඩ හා සේවා නිෂ්පාදනය කිරීම,බෙදා හැරීම හා සම්බන්ධ වූ සියළුම කටයුතු වේ.**

උදාහරණ



# ව්‍යාපාරිකයා

## ව්‍යාපාරික කටයුතුවල නිරතවන පුද්ගලයන්ය







# ව්‍යාපාරවල ගති ලක්ෂණ

- ව්‍යාපාරයේ සම්පත් ගනුදෙනුවල යෙදීම
- ගනුදෙනු අඛණ්ඩව සිදුවීම
- අරමුණක් පැවතීම
- අවදානමක් පැවතීම
- මිල මත ගනුදෙනු සිදුවීම
- ආර්ථික කටයුත්තක් වීම

| ගති ලක්ෂණ | පැහැදිලි කිරිම |
|---|---|
| ව්‍යාපාරයේ සම්පත් ගනුදෙනුවල යෙදීම | සෑම ව්‍යාපාරයක් විසින්ම භාණ්ඩ හා සේවා නිෂ්පාදනය කිරීම ,මිලදී ගැනීම හෝ විකිණීම සිදු කරයි |
| ගනුදෙනු අඛණ්ඩව සිදුවීම | ගණුදෙනු එකවර අවසන් නොවේ.මෙය දිගින් දිගටම සිදුවේ |
| අරමුණක් පැවතීම | ලාභ ලැබීම හෝ සමාජ සුභ සාධනය නැතහොත් ලාභය මූලික අරමුණ නොවූ ව්‍යාපාරද ඇත |
| අවදානමක් පැවතීම | මෙහිදී ලාභ ලැබීම පමණක් නොව පාඩු ලබන අවස්ථාද ඇත.එනම් ලැබෙන ප්‍රතිලාභය ස්ථිරවම කිව නොහැක |
| මිල මත ගනුදෙනු සිදුවීම | භාණ්ඩ විකිණීම මිලදී ගැනම සිදුවන්නේ මිල මත නැතහොත් මූල්‍යමය පදනම මතය |

# මිනිස් අවශ්‍යතා (Human Needs)

ජීවත් වීම උදෙසා මිනිසා විසින් අනිවාර්යයෙන් සපුරා ගත යුතු දෑ අවශ්‍යතා වේ.



# අවශ්‍යතා වල ලක්ෂණ:-

**01.අත්‍යවශ්‍ය වීම**

ජීවත්වීම සඳහා අනිවාර්යයෙන් සපුරාගත යුතු වීම මේවා නොමැතිව මිනිසාට ජීවත් විය නොහැකි වීම

උදා :- ආහාර ,නිවාස,ඇඳුම් පැළඳුම්

**02.පොදු වීම -**

සෑම පුදගලයෙකුගේම අවශ්‍යතා එක සමාන වීම අහාර, ඇඳුම්, පැළඳුම් පුද්ගලයාගෙන් පුද්ගලයාට වෙනස් නොවීම

**03.නිර්මාණය කල නොහැකි වීම**

අවශ්‍යතා නිසඟයෙන් බිහි වීම එබැවින් මේවා ව්‍යාපාරිකයන්ට බිහි කල නොහැකි වීම

**04.සීමිත වීම**

අවශ්‍යතා සංඛ්‍යාත්මකව ඉතා අඩු මට්ටමක පැවතීම

# පාරිභෝගික වුවමනා - Customer Wants

**අවශ්‍යතා සපුරාගන්නා විවිධ අකාර වුවමනා වේ.**

*අවශ්‍යතාවය* - වුවමනාව

i. ආහාර - බත් ,පාන් ,කඩල ,මුං ඇට , කවුපි

ii. ඇඳුම් - සාරිය , නිළ ඇඳුම් , පාවහන්

iii. නිවාස - මහල් නිවාස, තට්ටු නිවාස,පැල්පත්

iv. අධ්‍යාපනය - ගුරුවරු, අන්තර්ජාලය,පාසල්,පරිගනක

v. සෞඛ්‍යය - රජයේ රෝහල්,පෞද්ගලික රෝහල්,ආයුර්වේද

vi. ආරක්ෂාව - පෞද්ගලික ආරක්ෂක සේවා, රක්ෂණය

## වුවමනා වල ප්‍රධාන ලක්ෂණ :

### 01.අත්‍යවශ්‍ය නොවීම

ජීවත්වීම සදහා වුවමනා සපුරා ගැනීම අනිවාර්ය නොවේ.ඒ හා සමාන වෙනත් වුවමනාවකින් වුවද එම අවශ්‍යතාවය සපුරාගත හැකිය.

### 02.විවිධ වීම

අවශ්‍යතා සෑම පුද්ගලයකුටම පොදු වුවද වුවමනා සපුරා ගැනීම පුද්ගලයාගෙන් පුද්ගලයාට වෙනස් වීම

මේ සදහා රුචි අරුචිකම් ,සමාජ තත්වය ,ආදායම බලපෑම

### 03.නිර්මණය කල හැකි වීම

වුවමනා ව්‍යාපාරිකයන්ට නිර්මාණය කල හැකි වීම

### 04.සංකීර්ණ වීම

වුවමනා අසීමිත වීම නිසාත් ,විවිධ වීම නිසාත් සපුරාගන්නා අකාරය සංකීර්ණ වේ

### 05.අසීමිත වීම

එක් අවශ්‍යතාවයක් සපුරා ගැනීම සදහා වුවමනා කිහිපයක් භාවිතා කල හැකි වීම

* ලෝකයේ වෙසෙන ඕනෑම පුද්ගලයෙකු උපදින්නේ අවශ්‍යතා වුවමනා ඇතිවයි. මෙලොව එළිය දුටු දා පටන් ඔවුන් විවිධ ආකාරයේ අවශ්‍යතා වුවමනා ඉටු කර ගනී.ඒ මනුෂ්‍ය ස්භාවයයි.ඒ අනුව ව්‍යාපාර බිහි වන්නේද මෙම අවශ්‍යතා හා වුවමනා සැපිරීම සදහාය

* ව්‍යාපාරිකයන් විසින් අවශ්‍යතා බිහි නොකලත් එම අවශ්‍යතා සපුරා ගැනීමට අවශ්‍ය විවිධ ක්‍රම බිහි කරයි මිනිසාගේ පැවැත්මට ඒ තරම්ම මේවා වැදගත් වන නිසාය.


* මිනිසා විසින් අවශ්‍යතා හා වුවමනා සපුරා ගන්නා විවිධ ආකාර :-

* 01.නිෂ්පාදනය කිරීමෙන්

* 02.සොරකම් කිරීමෙන්

* 03.හුවමාරු කිරීමෙන්

* 04.සිඟමන් යැදීමෙන්






# අවශ්‍යතා හා වුවමනා අතර වෙනස්කම්

| අවශ්‍යතා | වුවමනා |
| --- | --- |
| 1.මූලිකව පැන නගියි | අවශ්‍යතාව මතුවූ පසු දෙවනුව පැන නගියි |
| 2. සීමිතය | එක් අවශ්‍යතාවක් ඉටුකර ගැනීමට වුවමනා රාශියක් ඇත |
| 3. සියළු දෙනාටම පොදුය | එක් එක් අයගේ පෞද්ගලිකත්වය අනුව වුවමනා විවිධ වේ |
| 4. උත්පත්තියත් සමග ඇතිවේ | පුද්ගලයන්ට අවශ්‍ය පරිදි ව්‍යවසායකයින් හෝ ව්‍යාපාරිකයින් නිර්මාණය කරයි |

# භාණ්ඩ හා සේවා




එනම්

මිනිස් අවශ්‍යතා හා වුවමනා සපුරාලන ඕනෑම දෙයක් වේ










# භාණ්ඩ හා සේවාවල ලක්ෂණ

| භාණ්ඩ | සේවා |
|---|---|
| ස්පෘශ්‍ය වේ. භෞතික පැවැත්මක් ඇත | අස්පෘශ්‍ය වේ. භෞතික පැවැත්මක් නැත |
| ගබඩා කල හැකිය | ගබඩා කල නොහැකිය |
| සමජාතීය බව ආරක්ෂා කල හැකිය | සමජාතීය බව ආරක්ෂා කල නොහැකිය. පුද්ගලයාගෙන් පුද්ගලයාටත්,අවස්ථාවෙන් අවස්ථාවටත් වෙනස් වේ |
| පාරිභෝගිකයා නිෂ්පාදන ක්‍රියාවලියට අත්‍යාවශ්‍ය නොවේ | බොහෝවිට පාරිභෝගිකයා නිෂ්පාදන ක්‍රියාවලියේ කොටසකි |
| සපයන්නාගෙන් වෙන්කළ හැක | සපයන්නාගෙන් වෙන්කළ නොහැක |


# ව්‍යාපාරිකයා Vs ව්‍යවසායකයා








## ව්‍යාපාරිකයා සහ ව්‍යවසායකයා අතර සමානකම්





- ආර්ථික කටයුත්තක යෙදීම
- අවදානමකට මුහුණදීම
- ගනුදෙනුවල නිරතවීම
- සම්පත් භාවිත කිරීම
- තරඟයකට මුහුණදීම
- පැවැත්ම ගැන සිතීම
- නිෂ්පාදනය මිලදීගැනීම හා විකිණීම සම්බන්ධ තීරණගැනීම
- ස්වයං පෙළඹවීමක් තිබීම

# ව්‍යාපාරිකයා සහ ව්‍යවසායකයා අතර වෙනස්කම්

| ව්‍යාපාරිකයා | ව්‍යවසායකයා |
|---|---|
| සාම්ප්‍රදායික හා ගතානුගතික ක්‍රමයට ව්‍යාපාර වල යෙදීම | නිර්මාණශීලීව නවෝත්පාදන පදනම් කරගනිමින් ව්‍යාපාර වල යෙදීම |
| අවදානම් භාරගැනීමට කැමැත්තක් නොදක්වයි | අවදානම තක්සේරු කර දැරිය හැකි අවදානම් භාරගනියි |
| තරඟයට මුහුණදීමට කැමැත්තක් නොදක්වයි | තරඟය කැමැත්තෙන් සොයා යයි |
| පවතින සම්පත් වලින් ප්‍රයෝජන නොගනියි | පවතින සම්පත් වලින් උපරිම ප්‍රයෝජන ගනියි |
| ගතානුගතික ක්‍රමයට ගැටළු විසඳයි | ගැටළු නිර්මාණශීලීව විසඳයි |
| ආසන්න ඉලක්ක ඇතිකරගනියි | දිගුකාලීන ඉලක්ක ඇතිකරගනියි |
| ව්‍යාපාර තිබෙන තත්වයෙන්ම පවත්වාගනියි | ව්‍යාපාර දිනෙන් දින පුළුල් කර ගනියි |

# සෑම ව්‍යාපාරිකයෙකුම ව්‍යවසායකයෙකු නොවේ
# සෑම ව්‍යවසායකයෙකුම ව්‍යාපාරිකයෙකු නොවේ



# ව්‍යවසායකයින් වර්ග














# ව්‍යවසායකයින් වර්ග 3කි

- ව්‍යාපාර ව්‍යවසායකයෝ
- සාමාජයීය ව්‍යවසායකයෝ
- අභ්‍යන්තරික /ආයතනිකව්‍යවසායකයෝ

# ව්‍යාපාර ව්‍යවසායකයෝ

ලාභ අපේක්ෂාවෙන් ව්‍යාපාර කටයුතුවල නිරත වන ව්‍යවසායකයන්ය

උදාහරණ - සිල්ලර වෙළඳසැල්





ඇපල් ව්‍යාපාරයේ නිර්මාතෘ



ධම්මික පෙරේරා මහතා

# සමාජයීය ව්‍යවසායකයෝ

සමාජයේ ප්‍රශ්නවලට නිර්මාණශීලීව විසඳුම් ඉදිරිපත්කරන පුද්ගලයෝය


උදා:-



සී.ඩබ්.ඩබ්.කන්නන්ගර මැතිතුමා



මොහොමඩ් යූනුස් මැතිතුමා



මහත්මා ගාන්ධි මැතිතුමා



මාරි කියුරි මැතිණිය

# අභ්‍යන්තරික / ආයතනික ව්‍යවසායකයෝ

ආයතන වල ඉහළ තනතුරු දරණ ව්‍යවසායකත්ව ගුණාංග ඇති පුද්ගලයෝය




ලංකා බැංකුව - විශිෂ්ඨතම ශාඛාව

හා කළමනාකරු - වාද්දුව




**2020 ආයතනික විශිෂ්ඨයන්**

## ඇගයීම

1. අවශ්‍යතා හා වුවමනා යන්න හඳුන්වා ඒවායේ වෙනස්කම් වගුගත කරන්න.
2. භාණ්ඩ හා සේවාවන් හඳුන්වා ඒවායේ ලක්ෂණ දක්වන්න.

3.පහත ලක්ෂණ අයත්වන්නේ ව්‍යාපාරිකයාටද ව්‍යවසායකයාටද යන්න දක්වන්න

- නව වෙළඳපළ සොයා යාම
- දිගුකාලීන ඉලක්ක ඇතිකරගනියි
- ගතානුගතිකව සිතයි
- ඉක්මනින් ලාභ ලැබීම
- දැරිය හැකි අවදානමක් භාරගනියි

4. ව්‍යාපාර වල ලක්ෂණ මොනවාද

5.පහත පුද්ගලයින් අයත්වන්නේ ව්‍යවසායක වර්ගයටද යන්න දක්වන්න

- සිල්ලර වෙළඳ ව්‍යාපාරිකයා
- සී.ඩබ්.ඩබ්. කන්නන්ගර මැතිතුමා
- ඵලදායීතා සම්මානය දිනූ පාසලක විදුහල්පතිතුමා
- බිල් ගේට්ස් මහතා


Thank
you